# අ.පො.ස (සා.පෙළ) සිසුන් දහම් පාසල් අධ්‍යාපනය ලැබීමේ ප්‍රවණතාවය

එම්.ඩී.එම්. උබේසේන[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින්නේ පාසල කේන්ද්‍රස්ථානය කරගත් අධ්‍යාපන ක්‍රමයකි. අතීතයේ පැවතියේ පන්සල මුල්කර ගත් අධ්‍යාපන ක්‍රමයකි. මහින්දාගමනයත් සමඟ බුදු දහම හා බැඳි අධ්‍යාපන රටාව ආරම්භ විය. බටහිර ජාතීන්ගේ ආගමනයත් සමඟ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පාසල බවට පත් විය. පන්සලට දෙවැනි ස්ථානය හිමි විය. ශ්‍රී ලංකාවේ පාසල් සතියට දින 05ක් පැවැත්වේ. පන්සල මුල් කර ගත් දහම් පාසල් අධ්‍යාපනය ලබා දෙන්නේ ඉරිදාය. දහම් පාසල තුලින් සිසුන්ට අවශ්‍ය ගුණ දහම් මෙන්ම බුදු දහම පිළිබඳව දැනුම ලබා දේ. පාසලේ මෙන් ම දහම් පාසලේ ද 11 ඉහළ ශ්‍රේණි දක්වා පංති පැවැත්වේ. පාසල්වල 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා බහුතර සිසුන් ප්‍රමාණයක් සිටිනු ලැබේ. දහම් පාසල්වල ප්‍රාථමික අංශයේ බහුතර සිසුන් ප්‍රමාණයක් දක්නට ලැබෙන නමුත් ඉහළ ශ්‍රේණිවල සිසුන් ඇත්තේ අඩු ප්‍රමාණයකි. වර්තමානය වන විට දහම් පාසල්වල 10, 11 ශ්‍රේණිවල සිසුන් අඩු වීම ගැටලුවක් බවට පත්ව තිබේ. අ.පො.ස (සා.පෙළ) සිසුන් දහම් පාසල් අධ්‍යාපනය ලැබීමේ අඩු ප්‍රවණතාවයට බලපාන සාධක සොයා බැලීම පර්යේෂණ අරමුණ කරගනිමින් රුවන්වැල්ල අධ්‍යාපන කොට්ඨාශයේ කෑ/ දෙහි/ ඉඹුලාන මහා විද්‍යාලය, රුවන්වැල්ල මධ්‍ය විද්‍යාලය, නිවුන්හැල්ල කනිටු විද්‍යාල වලින් 10, 11 ශ්‍රේණිවල සිසුන් අතරින් සිසුන් 100ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගනිමින් සමීක්ෂණයට භාජනය කරන ලදී . ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මඟින් රැස්කර ගන්නා ලද ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත මඟින් ලබා ගන්නා ලද දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයේ දී දහම් පාසල් වලට සහභාගී වන සිසුන් ප්‍රමාණය 30% ක් බවත්, සහභාගී නොවන සිසුන් ප්‍රමාණය 70% බවත් හේතු විය. සහභාගී නොවන සිසුන්ගෙන් 90% ක් දහම් පාසල් නොයෑමට ප්‍රධාන හේතුව ලෙස, ඉරිදා දින පෞද්ගලික උපකාරක පන්ති සඳහා සහභාගී වීම දැක්විය හැකිය. වෙනත් හේතූන් ලෙස අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල මත අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාව තෝරා ගැනීම සිදු කිරීම, අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී විෂයයන් 09කට පිළිතුරු සැපයීම ආදිය දැක්විය හැකිය. මේ හේතු නිසා 11 ශ්‍රේණිවල සිසුන් දහම් පාසල් අධ්‍යාපන ලැබීමේ ප්‍රවණතාව අඩුවී ඇති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *අ.පො.ස(සා.පෙළ), දහම් පාසල් අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
madusanka57ubesena@gmail.com